# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1370/10 – 2004 දෙසැම්බර් 08 වැනි බදාදා – 2004.12.08

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ජේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2004 අංක 163 දරන ආඥාව**

මගේ යොමු අංකය : 13/97/වීර්/445.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : 02/5/001/2060.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, පහත සඳහන් උප ලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

අනුර දිසානායක,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

2004 නොවැම්බර් මස 30 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.– ප්‍රාදේශීය ලේකම්, ජා-ඇල.

2. ඉඩමේ විස්තරය. – ගම්පහ දිස්ත්‍රික්කයේ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාගම්පත්තුව සුළු කොට්ඨාශයේ දැඩිගම ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක ගම් 3212 හා 2003.03.21 දින දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0658 ක් වන සෙලීගෙකොටුව නමැති පහත සඳහන් මායිම් තුල පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අංක 1 – සෙලීගෙකොටුව – ප්‍රමාණය : හෙක්. 1.0658
උතුරට: කේ. ජෝනස් පෙරේරා හිමිකම් කියන පල්කඩේ කුඹුර, පල්කඩේ ඕවිට; නැගෙනහිරට : කේ. ජෝනස් පෙරේරා හිමිකම් කියන පල්කඩේ ඕවිට, පී. පී. ගම් 2925 හි කැබලි අංක 1 සහ 22 සහ කේ. ඒ. ඒ. පී. ජයවර්ධන හිමිකම් කියන කැබැල්ලගහවත්ත; දකුණට: කේ. ජී. ක්ලෙමන්ට් හිමිකම් කියන හුන්නගෙ කුඹුර; බටහිරට : ලුබිගස් දෙපා ඇළ.

12 – 639

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ජේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2004 අංක 162 දරන ආඥාව**

මගේ යොමු අංකය : 13/97/වීර්/445.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : 02/05/001/2060.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලයදෙන ලද වෙනත් නිලධාරියකුට එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

අනුර දිසානායක,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය.

2004 නොවැම්බර් මස 30 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ජා-ඇල.

2. **ඉඩමේ විස්තරය.** – ගම්පහ දිස්ත්‍රික්කයේ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාගම්පත්තුව සුළු කොට්ඨාශයේ දඬුගම ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක. ගම් 2944 හා 1999.07.06 දින දරන මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5722 ක් වන සෙලීගෙකොටුව නමැති පහත සඳහන් මායිම් තුල පිහිටි ඉඩම් කැබලි 2 (දෙකට)ට මායිම්:

01. **කැබලි අංක 1 – සෙලීගෙකොටුව – ප්‍රමාණය : හෙක්. 0.0372**

උතුරට: කේ. ජෝනස් පෙරේරා හිමිකම් කියන පල්කඩේඹිවිට; නැගෙනහිරට : මාර්ග (ප්‍රා.ස) සහ ඩබ්. එස්. ඒ. ඔපීලියා ප්‍රනාන්දු හිමිකම් කියන පල්කඩවත්ත; දකුණට: ඩබ්. එස්. ඒ. ඔපීලියා ප්‍රනාන්දු හිමිකම් කියන පල්කඩවත්ත සහ කැබලි අංක 2; බටහිරට : සුරේෂ් ප්‍රනාන්දු හිමිකම් කියන සෙලීගෙකොටුව.

02. **කැබලි අංක 2 – සෙලීගෙකොටුව – ප්‍රමාණය : හෙක්. 0.5350 ක් පමණ**

උතුරට: කැබලි අංක 1 සහ මාර්ග (ප්‍රා.ස); නැගෙනහිරට : මාර්ග (ප්‍රා.ස), ඩබ්. එස්. ඒ. ඔපීලියා ප්‍රනාන්දු හිමිකම් කියන පල්කඩවත්ත සහ කේ. ඒ. ඒ. පෙරේරා ජයවර්ධන හිමිකම් කියන කැබැල්ලගහවත්ත; දකුණට: කේ. ඒ. ඒ. පෙරේරා ජයවර්ධන හිමිකම් කියන කැබැල්ලගහවත්ත සහ කේ. ජේ. ක්ලෙමන්ට් පෙරේරා හිමිකම් කියන හුන්නගේ කුඹුර; බටහිරට : සුරේෂ් ප්‍රනාන්දු හිමිකම් කියන සෙලීගෙකොටුව.

12 – 638

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී